# " අපේ ආරවුල් සමථකරණයෙන් නිරවුල් කර ගනිමු "




"ආරවුලක් විසඳගන්න
සැමටම ජය ලබා ගන්න
සමථ මූල මණ්ඩලයට
ඔබේ ගැටළු යොමු කරන්න"

දැන් ඔබේ ආරවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇති පැමිණිළි පෙට්ටියට බහාලීම හෝ සමථ නිලධාරී වෙත බාර දීම මගින් සමථ මූල මණ්ඩලයට යොමු කළ හැකියි

ජූලි 18 වන දිනට යෙදෙන ජාතික සමථ දිනයට සමගාමීව ආරවුල් සමථකරණයට යොමු කිරීමේ ක්‍රියාවලිය තව දුරටත් ව්‍යාප්ත කිරීම සඳහා පහසුකම් සැලසීමක් ලෙස, මෙතෙක් ජනතාව විසින් සමථ මූල මණ්ඩල සභාපතිවරුන් වෙත පමණක් යොමු කළ ආරවුල් දිවයින පුරා සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම ස්ථාපිත කරනු ලබන " පැමිණිළි පෙට්ටි " වෙත බහාලීම මගින් සමථ මූල මණ්ඩලයට යොමු කිරීමට ද අවස්ථාව සැලසෙනු ඇත. ඒ සඳහා සමථ මූල මණ්ඩල සභාපතිවරයා ආමන්ත්‍රණය කරන ලද ලිපියක පහත කරුණු අන්තර්ගත විය යුතුය.

- ආරවුල යොමු කරන පුද්ගලයාගේ නම හා ලිපිනය,
- ආරවුලට සම්බන්ධ අනෙක් පාර්ශවයේ නම හා ලිපිනය,
- ආරවුල පිළිබඳ කෙටි විස්තරයක්
- මුද්දර ගාස්තුව ලෙස රුපියල් 5.00 මුද්දරයක් අලවා එය අවලංගු කර තිබීම.




වැඩි විස්තර සඳහා www.mediation.gov.lk වෙත පිවිසෙන්න

අධිකරණ අමාත්‍යාංශය
நீதி அமைச்சு
Ministry of Justice

සමථ මණ්ඩල කොමිෂන් සභාව
மத்தியஸ்த சபைகள் ஆணைக்குழு
MEDIATION BOARDS COMMISSION

අනුග්‍රහය - ආසියා පදනම